# ඇබෑර්තු

**සතොස**

## රජය සතු විශාලතම අලෙවිසැල් ජාලය සඳහා
## නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය

**සුදුසුකම් (පහත සඳහන් 01 හෝ 02)**

(01) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබූ ගණකාධිකරණය/ මූල්‍ය කළමනාකරණය/ වාණිජ්‍ය / අලෙවිකරණය පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම.

සහ

තනතුරට අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් (Masters') හෝ තනතුරට අදාළ ක්ෂේත්‍රයක වරලත් වෘත්තිය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය (Associate Membership) ලබා තිබීම.

සහ

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ ප්‍රසිද්ධ පුද්ගලික ආයතනයක සනාථ කළ සේවා වාර්තාවක් සමග කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) පළපුරුද්ද සහ ඉන් වසර පහක් (05) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

(02) තනතුරට අදාළ ක්ෂේත්‍රයක වරලත් වෘත්තිය ආයතනයක යාවජීව සාමාජිකත්වය (Fellow Membership) ලබා තිබීම.

සහ

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ ප්‍රසිද්ධ පුද්ගලික ආයතනයක සනාථ කළ සේවා වාර්තාවක් සමග කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) පළපුරුද්ද සහ ඉන් වසර පහක් (05) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

**වයස :** අවුරුදු 45 ට නොඅඩු සහ අවුරුදු 60 ට නොවැඩි විය යුතුය.

**වැටුප් හා අනෙකුත් දීමනා :** මූලික වැටුප : රු. 150,000/- (කාර්ය සාධන දීමනාව : රු.75,000/- + ප්‍රවාහන දීමනාව රු. 50,000/- + මාසික ඉන්ධන දීමනාව : රු. 15,000/- + ජංගම දුරකථන ප්‍රතිපූර්ණය රු.9,000/- මාසිකව මෙම තනතුර සඳහා හිමිය)

**පත්වීමේ ස්වභාවය :** කොන්ත්‍රාත් තනතුරකි. සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට හිමිකම් ඇත.

**සුදුසුකම්ලත් අයදුම්කරුවන්,**

- දත්ත අගැයුම්කිරීමේ, සමාලෝචනය කිරීමේ, අර්ථ නිරූපණය කිරීමේ හැකියාව සමග විශිෂ්ඨ විශ්ලේෂණාත්මක ගැටළු විසඳීමේ සහ සංවිධානමය කුසලතා තිබිය යුතුය.ඉහළ ස්වයං අභිප්‍රේරණයක් සහිත පුද්ගලයෙකු විය යුතුය.
- ඉහළ නායකත්ව ගුණාංග, අන්තර් පුද්ගල සන්නිවේදන හැකියාවන්ගෙන් යුක්ත විය යුතුය.
- ප්‍රශස්ත මට්ටමේ තොරතුරු තාක්ෂණ හැකියාවෙන් යුක්ත විය යුතුය.
- බහුවිධ කණ්ඩායම් මෙහෙයවීමට සහ අධීක්ෂණය කිරීමට හැකි බවට සනාථ කළ හැකි සාධක තිබිය යුතුය. මානව සහ වෙනත් සම්පත් කාර්යක්ෂමව කළමණාකරණයට හා නිසි ලෙස යෙදවීමට පළපුරුද්ද තිබිය යුතුය.

**අනෙකුත් :**

**සෑම අයදුම්කරුවෙකුම,**

I. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
II. ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි මනා ශාරීරික සහ මානසික යෝග්‍යතාවයකින් හෙබි අයෙකු විය යුතුය.
III. විශිෂ්ඨ පෞරුෂයකින් හෙබි අයෙකු විය යුතුය.

ඔබට නියම සුදුසුකම් හා පළපුරුද්ද ඇතිනම්, ඔබගේ ජීවදත්ත ලේඛනය, සහතික වල ඡායා පිටපත් සමග මෙම දැන්වීම පළවී දින 14 ක් ඇතුලත ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට යොමු කරන්න. නැතිනම් **vacancies@lankasathosa.org** යන විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කරන්න (ඉල්ලුම් කරනු ලබන තනතුර ලිපි කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි / විද්‍යුත් තැපැල් පණිවුඩයෙහි **"Subject"** තීරුවෙහි සඳහන් කළ යුතුය).

(ආයතනය ලිපි ගනු දෙනු කරනු ලබන්නේ ලේඛන ගත තෝරාගත් අයදුම්කරුවන් සමග පමණි.)

වෙළඳ අමාත්‍යංශය

සභාපති,
ලංකා සතොස ලිමිටඩ්, සතොස මහලේකම් ගොඩනැගිල්ල,
අංක 27, 05 වන මහළ,චොක්ෂෝල් වීදිය, කොළඹ 02

**සතොස**